# ඩොගී



රශිනි විමර්ශා රත්නායක

# ඩොගී

රශිනි විමර්ශා රත්නායක

# ඩොගී

© රශිනි විමර්ශා රත්නායක

**කතෘ ප්‍රකාශනයකි**

**කතෘගේ වෙනත් කෘති**

* නුවණක්කාරයෝ

* කරුණාවන්ත බිංදු

**කෘතිය ප්‍රකාශයට පත් කරන දිනය - 2025.02.08**

**ISBN No: 978-624-208-565-4**

# පිදුම

=====

ආදරණීය අම්මාටත්,

අප්පච්චිටත්,

අත්තම්මා හා අත්තාටත්

මම

මේ පොත

පුදමි!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක ගමක හිටියා මීනු කියලා ළමයෙක්. මීනු ඉගෙනීමට හරි ම දක්ෂයි. එයා ඉන්නේ පහ වසරේ. එයා හැමදාම පන්තියේ පළවෙනියා වෙනවා.



එයා ශිෂ්‍යත්වය සමත් වුණොත් එයාට බලු පැටියෙක් ගේනවා කියලා එයාගේ තාත්තා කිව්වා. ඒ නිසා එයා දැන් හොඳට පාඩම් කරනවා.



ඒත් එයාගේ අක්කා හසිනි නම් කිව්වේ බල්ලෝ එපා කියලා.

ඒ වුණාට මීනුට ඕන වුණේ බල්ලෙක්වමයි. අක්කා නම් තරහෙන් හිටියේ.



මීනු හැමවෙලාවෙම හිතුවේ මම විභාගය සමත් වෙනවා කියලා. තව දවස් දෙකකින් විභාගය. මම සමත් වෙනවාමයි කියලා එයා හිතුවා.


අදයි ශිෂ්‍යත්ව විභාගය දවස.

"අම්මේ මම විභාගය සමත් වෙනවා මයි" කියලා එයා ගෙදරින් ගියේ. එයා හොඳට විභාගයට මුහුණ දුන්නා.

ටික දවසක් ගත වුණා. ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිපල ආවා. එයා හොඳට විභාගය සමත් වෙලා.



තාත්තා එයාට බලු පැටියෙක් ගෙනත් දුන්නා.



මීනු එයාට නමක් දැම්මා ඩොගී කියලා. හැබැයි අක්කා නම් ඩොගීට කිව්වේ බලු තඩියා කියලා.



තාත්තා කිව්වේ ඩොගීව පාරේදී හම්බවුණා කියලා.

මීනු දවසක් ඉස්කෝලේ ඇරිලා ගෙදර එනකොට දැක්කා පෝස්ටරයක්.



ඒකෙ හිටියේ ඩොගී. නැතිවෙලා කියලයි තිබුණේ. ඒකෙ දුරකථන අංකයක් තිබුණා. මීනු ඉක්මනට ඒ අංකය ලියාගත්තා.

මීනු ගෙදර ගිහින් ඒ අංකයට කෝල් එකක් ගත්තා. අනිත් පැත්තෙන් කතා කරෙත් පුංචි ගැහැණු ළමයෙක්. එයාගේ නම තමී කියලා කිව්වේ. එයාට තමයි බලු පැටියව අයිති.

"මම ඩොගීව ගන්න එන්න ද?" තමී ඇහුවා. මීනු එයාගේ ගෙදරට එන පාර තමීට කිව්වා.

තමී පහුවදා මීනු ගේ ගෙදර ආවා. එත් මීනුට ඩොගීව දෙන්න දුකයි.



ඊට පස්සේ තමී කිව්වා "ඩොගීට හම්බෙන පැටියව මම ඔයාට දෙන්නම්" කියලා. මීනු ඒකට එකඟ වුණා.

ටික දවසකින් ඩොගීට පැටියෙක් ඉපදුණා.



තමී එයාව මීනුට දුන්නා.



මීනු එයාට රොක්සි කියලා නම දැම්මා. හැමදෙනා ම සතුටින් හිටියා.



# නිමි.

☺

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන!

*ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,*

*සෙනෙවිරත්න මහලේකම්*